ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No . | දිනය / திகதி / Date. 2025.07.21 |
|---|---|---|

ඒ.ඒ.කේ.අරඹේවත්ත මහතා,
අංක. 29/98, පීරිස්වත්ත,
අම්පිටිය පාර, මහනුවර.

**පැමිණිලිකාර පාර්ශවය**

01. විදුහල්පති,
මහ/ධර්මරාජ විද්‍යාලය, මහනුවර.

02. කේ.කේ.පී. ආරියසිංහ මයා
සභාපති - සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය
විදුහල්පති (හිටපු), මහ/ධර්මරාජ විද්‍යාලය, මහනුවර.
(වර්තමාන සේවා ස්ථානය : අධ්‍යාපන අමාත්‍යාංශය)

03. එච්. එම්. එස්. පී. හේරත් මිය
ලේකම් - සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය
මහ/ධර්මරාජ විද්‍යාලය, මහනුවර.

04. යූ. ජී. පී. ආර්. ප්‍රේමතිලක මිය
සාමාජිකා - සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය,
නියෝජ්‍ය විදුහල්පති, මහ/ධර්මරාජ විද්‍යාලය, මහනුවර.

05. ජේ. එච්. එම්. ජී. ඩී. එස්. සමරකෝන් මිය
සභාපති - අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
විදුහල්පති, පුෂ්පදාන බාලිකා විද්‍යාලය, මහනුවර.

06. එස්. ජයතිස්ස මයා
ලේකම් - අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
නියෝජ්‍ය විදුහල්පති, මහ/ධර්මරාජ විද්‍යාලය, මහනුවර.

**වගඋත්තරකාර පාර්ශවය**


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති / தவிசாளர் / Chairman | 011- 2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011- 2505541/74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrcsl@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම් / செயலாளர் / Secretary | 011- 2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

පැමිණිලි අංකය : HRC/KND/741/24/A

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

ඉහත නම් සදහන් පැමිණිලිකාර පාර්ශවය විසින් 2024.12.23 දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් කියා සිටින්නේ, තම දරුවා 2025 වර්ෂයේ මහ/ ධර්මරාජ විද්‍යාලයේ පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම්පත්‍රයක් යොමු කර ආර්එස් - 247 යටතේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 85ක් ලබාගත් බවත්, තාවකාලික ලේඛනයේ ගෘහ මූලික ගණය යටතේ තෝරා ගත් අවම ලකුණු වූයේ, ලකුණු 78 වූ නමුත්, පත්ඉරු සහිත ලියාපදිංචි බදු ඔප්පුව, වෙනත් පිළිගත හැකි ලේඛන හා ඡන්ද නාමලේඛන ඇතුළු පදිංචිය තහවුරු කරන සියලු අවශ්‍යතා සපුරා තිබියදී තම දරුවාගේ නම තාවකාලික ලේඛනයට ඇතුළත් කර නොතිබුණු බවත් ය.

එසේම, තමාගේ වැඩිමහල් දියණිය මෙම ලිපිනයෙහි පදිංචිව සිටියදී අදාළ ලේඛනවලට අනුව 2018 වර්ෂයේ මහ/ මහමායා බාලිකා විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කළ බවත්, දැනට ඇය එම විද්‍යාලයේ ඉගෙනුම ලබන බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත.

තවද, තමාගේ දරුවාගේ නම තාවකාලික නාම ලේඛනයෙහි ඇතුලත්ව නොතිබූ බැවින්, මහ/ ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිතුමා වෙත අභියාචනයක් යොමු කළ බවත්, ඒ අනුව 2024.12.12 දින තමා අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් වුවද පළමු සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු 85හි කිසිදු වෙනස් කිරීමක් හෝ සංශෝධනයක් සිදුකර නොතිබූ නමුත්, 2024.12.23 දින ධර්මරාජ විද්‍යාලයේ ප්‍රදර්ශනය කරන ලද 2025 වර්ෂයේ 1 ශ්‍රේණියට සිසුන් ඇතුලත් කරගන්නා ස්ථිර නාම ලේඛනයේද තමාගේ දරුවාගේ නම ඇතුළත් නොවූ බවත්, එම ලේඛනයේ ගෘහ මූලික ගණය යටතේ සිසුන් තෝරා ගත් අවම ලකුණු ප්‍රමාණය ලකුණු 80 බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

තමාගේ පදිංචි ස්ථානයට ආසන්නම පාසල මහ/ ධර්මරාජ විද්‍යාලය වන අතර, වෙනත් පාසලක් සඳහා අයදුම් කර නොමැති බැවින්, ඉහත කරුණු පිළිබඳව අවධානය යොමු කර පරීක්ෂණයක් පවත්වා තමාගේ දරුවා 2025 වර්ෂයේ මහ/ ධර්මරාජ විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කර ගැනීමට අවස්ථාව සලසා දෙන මෙන් පැමිණිලිකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිල්ලට අදාළව 2 වන වගඋත්තරකරු වන මහනුවර ධර්මරාජ විද්‍යාලයේ හිටපු විදුහල්පති විසින් 2025.01.03 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් කියා සිටින්නේ, පැමිණිලිකරු විසින් ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේදි ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන සලකා බලා ලකුණු ප්‍රදානය කළ බවයි. එසේම, ලියාපදිංචි අංක 1463 දරණ බදු ඔප්පුවේ, දේපල පිළිබඳව සඳහන් උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇත්තේ, බිම් මහලේ සාලය, කාමර 01, කුස්සිය ඇතුලත් පරිශ්‍රය පමණක් කුලී පදනම මත ලබාදි ඇති බව වුවද, ස්ථානීය පරීක්ෂණයේදි අයදුම්කරු පදිංචිව සිටින ස්ථානය ලෙස

පෙන්වා දුන්නේ තනි මහලක නිවසක් බැවින් ඔප්පුවේ සඳහන් දේපල හා පෙන්වන ලද ස්ථානය අතර නොගැලපීමක් මතුවීම හේතුවෙන් තාවකාලික ලැයිස්තුවෙන් ඉවත් කරන ලද බවත්, ස්ථානීය පරීක්ෂාවේදී ද මුල්ම අවස්ථාවේදී නිවැසියන් වශයෙන් කිසිවෙකු එම නිවසේ රැඳී නොසිටි බවත් 2 වන වගඋත්තරකරු සිය වාර්තාව තුළින් දක්වා ඇත.

එසේම, මෙම පැමිණිලිකරු විසින් ඔහුගේ වැඩිමහල් දියණිය මහ/ මහමායා බාලිකා විද්‍යාලයට ඇතුලත් කිරීමට බදු ඔප්පුවක් සකස් කර ඇති බවත්, නැවත නැවත එම බදු ඔප්පුව අවලංගු වන සේ බදු ඔප්පු ගණනාවක් සකස්කර ඇති හෙයින් පත්ඉරු පරීක්ෂා කිරීමේදී මෙම ඉඩමේ අයිතිය පිළිබඳව ද ගැටලු මතුවී ඇති බවත්, ප්‍රදේශවාසීන් මේ පිළිබඳව විද්‍යාලය වෙත පෙත්සම්ද යොමු කර ඇති බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද, අභියාචනා මණ්ඩලය විසින් පැමිණිලිකරුගන් පදිංචි ස්ථානය පිළිබඳව තොරතුරු කිහිපවරක්ම විමසුවද ඔප්පුවේ සඳහන් දේපල හා පදිංචි ස්ථානය අතර නොගැලපීම පිළිබඳ කිසිඳු පැහැදිලි කිරීමක් ඔහු විසින් සිදුනොකළ බවත්, මෙම පදිංචිය තහවුරු කරනු ලබන ස්ථානයේ සිට ධර්මරාජ විද්‍යාලය වෙත පැමිණෙන දැනට 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන වමත්ක වීරසිංහ නැමැති දරුවා විසින් ටික දිනකට තමන් ඇතුළු පවුලේ අය මෙම පැමිණිලිකරුට අයත් පේරාදෙණියේ ඇති නිවසේ පදිංචිව සිටින බවට පැවසූ බවත්, අභියාචනා මණ්ඩලය විසින් සිදුකරනු ලැබූ පළමු ස්ථාන පරීක්ෂාවේදී අදාළ නිවසේ මෙම පැමිණිලිකරු හෝ කිසිවකු පදිංචිව නොසිටින බව සහ ඉඩමේ මුල් හිමිකරු හා බිරිඳ පමණක් පදිංචිව සිටි බව තහවුරු වූ බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

මෙම කරුණු අනුව පදිංචිය පිළිබඳව නිශ්චිතව තහවුරු නොවීම හා ඉදිරිපත් කළ ලේඛන හා ස්ථානය අතර නොගැලපීම යන කරුණු මත පැමිණිලිකරුගේ ලකුණු නීත්‍යානුකූල නොවන බවට තීරණය කරන ලද බව ද 2 වන වගඋත්තරකරු සිය වාර්තාව මගින් දක්වා ඇත.

**නිරීක්ෂණ**

පැමිණිලිකාර ඒ.ඒ.කේ.අරඹේවත්ත යන අය තම දරුවා වන සයෝන් දීරද අරඹේවත්ත යන අය 2025 වර්ෂයේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පළමුවන ශ්‍රේණියට ඇතුළත් කරගැනීම සඳහා ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්කර සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 85ක් ලබාගෙන ඇති බව ඉදිරිපත් කර ඇති ලකුණු ලේඛන අනුව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු කරගැනීම සඳහා වගඋත්තරකාර මහනුවර ධර්මරාජ විද්‍යාලය විසින් අවස්ථා තුනකදී ස්ථාන පරීක්ෂණ සිදුකර ඇති බව පෙනී යයි. 2024.10.07 වන දින ප.ව.1.30ට සිදු කරන ලද පළමු ස්ථානීය පරීක්ෂාවේ දී අදාළ නිවසෙහි කිසිවෙකු නොසිටි බවටත්, දුරකථනයෙන් සම්බන්ධ කරගත් බවටත්, නැවත පරීක්ෂා කළ යුතු බවටත් අදාළ ස්ථාන පරීක්ෂාව සිදු කරන ලද 3 වන සහ 4 වන වගඋත්තරකාරියන් විසින් සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ. 2025.02.17 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී මේ පිළිබඳව සිදු කළ විමසීමේ දී, පැමිණිලිකරු

එම අවස්ථාවේ දී නිවස අසල කඩයකට ගොස් සිටි බවත්, විද්‍යාලයෙන් පැමිණි නිලධාරිණියන් විසින් පැමිණිලිකරුගේ බිරිඳ හට දුරකථන ඇමතුමක් ලබා දී ඔවුන් නිවසට පැමිණි බව දැනුම් දීමත් සමඟ බිරිඳ පැමිණිලිකරු හට දුරකථනයෙන් ඒ බව දැනුම් දුන් බවත්, ඒ සමඟම පැමිණිලිකරු නිවස වෙත පැමිණි බවත්, එම අවස්ථාවේ දී ස්ථානීය පරීක්ෂාවට පැමිණි සිටි 3 වන සහ 4 වන වගඋත්තරකාරියන් මුණගැසුණු නමුත්, ඔවුන් ඒ අවස්ථාවේ දී නැවත නිවස පරීක්ෂාවට නොපැමිණි බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. එසේම, 3 වන සහ 4 වන වගඋත්තරකාරියන් විසින් ද එලෙස පැමිණිලිකරු මුණගැසුණු බවට 2025.02.17 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී ප්‍රකාශ කර ඇත.

එසේම, 2024.10.23 වන දින රාත්‍රී 9.30ට පමණ සිදු කරන ලද දෙවන ස්ථානීය පරීක්ෂාවේ දී අදාළ නිවසේ පැමිණිලිකරුගේ බිරිඳ සිටි බවට 2 වන වගඋත්තරකරු විසින් සටහන් යොදා ඇති බවත්, 2024.10.28 වන දින 7.05ට සිදු කරන ලද තෙවන ස්ථානීය පරීක්ෂාවේ දී අදාළ නිවසේ දරුවන් සහ දෙමව්පියන් සිටි බවට 3 වන වගඋත්තරකාරිය විසින් සටහන් යොදා ඇති බවත් පෙනී යයි.

ඒ අනුව අවස්ථා දෙකකදී පැමිණිලිකරු සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් අදාළ ලිපිනයේ සිට ඇති බවට  අදාළ ස්ථාන පරීක්ෂණ සටහන් මගින් සනාථ වේ.

කෙසේවෙතත් 2 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ඉහත කී 2025.01.03 දිනැති වාර්තාව මගින් හා 2025.02.17 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණය සඳහා සහභාගී වූ 1වන, 3වන, 4 වන සහ 6 වන වගඋත්තරකරුවන් විසින් සිදු කළ ප්‍රකාශ මගින් දක්වා ඇත්තේ, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද 2020.01.22 වන දින ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඩබ්. එන්. බී. එගොඩවෙලේ මහතා විසින් ලියා සහතික කර ඇති  අංක 1463 දරණ බදු ඔප්පුවේ සඳහන් දේපල හා පැමිණිලිකාර පාර්ශවය පදිංචි ස්ථානය අතර නොගැලපීමක් පවතින බැවින් පදිංචිය තහවුරු නොවන බවයි.

එකී නොගැලපීම ලෙස වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත්තේ ඉහත කී බදු ඔප්පුවෙහි උපලේඛනයෙහි වරිපනම් අංක 29/98 දරණ නිවසේ “බිම් මහලේ සාලය, කාමර එකයි, කුස්සිය ඇතුලත් පරිශ්‍රය පමණක්” වසර 5ක කාලයකට බදු පදනම මත ලබාදී ඇති බව සඳහන් වුවද, පැමිණිලිකරු පදිංචිව සිටින නිවස දෙමහල් නිවසක් නොව තනි මහලේ නිවසක් වන බැවින් බදු ඔප්පුවේ සඳහන් දේපල හා නිවස අතර නොගැලපීමක් පැවතීම යි. තවද, ඔප්පුව සකස් කර ඇත්තේ වෙනත් දේපලකට බවට ද 2 වන වගඋත්තරකරු විසින් සටහනක් යොදා ඇති බව ද පෙනී යයි. එසේම, 5 වන වගඋත්තරකාර අභියාචන සහ විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමිය විසින් ද “ඔප්පුවේ උපලේඛනයේ ‘බිම් මහල’ ලෙස සඳහන් වී තිබීම නිසා ප්‍රතික්ෂේප කරන ලදී” යනුවෙන් සටහනක් යොදා ඇති බව ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් වගඋත්තරකාර පාර්ශවය වෙත ඉදිරිපත් කර ඇති 2020.01.22 වන දින ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඩබ්. එන්. බී. එගොඩවෙලේ මහතා විසින් ලියා සහතික කර ඇති  අංක 1463 දරණ බදු

ඔප්පුවේ සඳහන් දේපල හා පැමිණිලිකාර පාර්ශවය පදිංචි ස්ථානය අතර නොගැලපීමක් පවතින්නේ නම් වගඋත්තරකාර පාර්ශවයට ඔප්පුවේ උපලේඛනයේ සඳහන් මායිම් සහ පැමිණිලිකරු පදිංචිව සිටි ස්ථානයේ මායිම් පරීක්ෂා කළ හැකිව තිබුණි. එහෙත් එවන්නක් සිදු කර ඇති බවක් නිරීක්ෂණය නොවන අතර, වගඋත්තරකාර පාර්ශවය විසින් ඉහත කී ලෙස නොගැලපීමක් පවතින බවට හුදු ප්‍රකාශයක් පමණක් සිදු කර ඇති බව පෙනී යයි.

එසේවුවද, අංක 252 අම්පිටිය උතුර වසමේ ග්‍රාම නිලධාරී විසින් 2025.06.06 වන දින නිකුත් කර ඇති පදිංචිය සහතික කිරීමේ ලේඛනය මගින් පැමිණිලිකරු පදිංචි නිවසෙහි වරිපනම් අංකය 29/98 වන බවත්, අදාළ ඉඩමේ පිහිටි නිවස තනි මහලක නිවසක් වන බවත් සඳහන් කර ඇත.

ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු පිළිගැනීම ගැටලු සහගත වන බවත්, පැමිණිලිකරු අදාළ ලිපිනයේ පිහිටි නිවසෙහි පදිංචිව සිටින බවට ග්‍රාම නිලධාරී විසින් තහවුරු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, 2 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2025.01.03 දිනැති වාර්තාව මගින් දක්වා ඇත්තේ පැමිණිලිකරු පදිංචිය තහවුරු කරනු ලබන ස්ථානයේ සිට ධර්මරාජ විද්‍යාලය වෙත පැමිණෙන දැනට 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන වමත්ක වීරසිංහ නැමැති දරුවා විසින් ටික දිනකට තමන් ඇතුළු පවුලේ අය මෙම පැමිණිලිකරුට අයත් පේරාදෙණියේ ඇති නිවසේ පදිංචිව සිටින බවට පැවසූ බවයි. ඊට අදාළව කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විමසීමේ දී පැමිණිලිකරු විසින් ප්‍රකාශ කරන ලද්දේ තමා හට පේරාදෙණිය ප්‍රදේශයේ නිවසක් නොමැති බවයි.

එසේම, ඉහත කී වමත්ක වීරසිංහ නැමැති දරුවාගේ මව වන ඉෂානි නිලෝෂනි මල්වත්තගේ යන අය විසින් 2025.06.25 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ ඇය ඡන්දය සඳහා ලියාපදිංචිව සිටින්නේ 29/98, පීරිස්වත්ත, අම්පිටිය පාර, මහනුවර යන ලිපිනයේ වන බවත්, එකී ලිපිනය සහිත නිවසේ කොටසක් පැමිණිලිකරු සඳහා වසර පහක කාලයක් සඳහා බදු දී ඇති බවත්, ඇයගේ ස්වාමි පුරුෂයා වන මාදප්පු මුදියන්සේලාගේ නිශාන්ත වීරසිංහ යන අය විදේශගතව රැකියාවක නිරත වන බවත්, ඇය තම දරුවන් දෙදෙනා වන මාදප්පු මුදියන්සේලාගේ වෙනුර දූෂාන් හිරුෂ වීරසිංහ සහ මාදප්පු මුදියන්සේලාගේ වමත්ක එෂාන් මිනුෂ වීරසිංහ යන අය සමඟ තම ස්වාමි පුරුෂයාගේ මව වන කංකානම් පතිරණගේ කුසුමාවතී යන අයට අයත් දේපලක් වන 394/09/ඒ, සරසවිගම, මහකන්ද, හිඳගල යන ලිපිනයේ පිහිටි නිවසේ පදිංචිව සිටින බවත් ය.

තවද, අංක 1162 ගල්ඔය වසමේ ග්‍රාම නිලධාරී විසින් ද ඉහත කී ඉෂානි නිලෝෂනි මල්වත්තගේ, ඇයගේ ස්වාමි පුරුෂයා සහ දරුවන් දෙදෙනා 394/09/ඒ, සරසවිගම, මහකන්ද, හිඳගල යන ලිපිනයේ පිහිටි නිවසේ පදිංචිව සිටි බවට තහවුරු කර ඇති බැවින් 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇති පරිදි පැමිණිලිකරුගේ නිවසක පදිංචිව සිටි බවට ප්‍රකාශ කර ඇති කරුණු ගැටලු සහගත වන බව ද කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

තවද, 2 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකරු අදාළ ලිපිනයේ පදිංචි නොමැති බවට විද්‍යාලය වෙත පෙත්සම් ලැබුණු බවට සඳහන් කර තිබුණ ද, එම සියලු පෙත්සම් නිර්නාමිකව ලැබී ඇති බැවින් ඒවායේ වලංගුතාවය සම්බන්ධයෙන් ගැටලු පවතින බව පෙනී යයි.

**<u>නිගමනය</u>**

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී අංක 252 අම්පිටිය උතුර වසමේ ග්‍රාම නිලධාරී විසින් 2025.06.06 වන දින නිකුත් කර ඇති පදිංචිය සහතික කිරීමේ ලේඛනය මගින් පැමිණිලිකරු පදිංචි නිවසෙහි වරිපනම් අංකය 29/98 වන බවත්, අදාළ ඉඩමේ පිහිටි නිවස තනි මහලක නිවසක් වන බවත් සඳහන් කර ඇති බැවින් පැමිණිලිකරු විසින් වගඋත්තරකාර පාර්ශවය වෙත ඉදිරිපත් කර ඇති 2020.01.22 වන දින ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඩබ්. එන්. බී. එගොඩවෙලේ මහතා විසින් ලියා සහතික කර ඇති අංක 1463 දරණ බදු ඔප්පුවේ සඳහන් දේපල හා පැමිණිලිකාර පාර්ශවය පදිංචි ස්ථානය අතර වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කරන ආකාරයේ නොගැලපීමක් නොපවතින බව නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලිකරු අදාළ ලිපිනයේ පිහිටි නිවසෙහි පදිංචිව සිටින බව වගඋත්තරකාර පාර්ශවය විසින් ද අවස්ථා දෙකකදී ස්ථානීය පරීක්ෂාවන් මගින් තහවුරු කරගෙන ඇති බැවින් පැමිණිලිකරුගේ පදිංචිය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් නොමැති බව සනාථ වේ.

එසේහෙයින්, පැමිණිලිකරු 2025 වර්ෂයේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 1 ශ්‍රේණිය සඳහා ආසන්න පදිංචිකරුවන් ගණය යටතේ අයදුම්කර සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 85ක් ලබාගනිමින් එකී ගණය යටතේ කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 80ක ප්‍රමාණය ඉක්මවා ලකුණු ලබාගෙන තිබියදී, වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු නොවන බවට තීරණය කර පැමිණිලිකරුගේ දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කර නොගැනීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය පසිඳලීම ද නීතිය ක්‍රියාත්මක කිරීම ද සෑම දෙනාටම එක හා සමාන විය යුතු බවට වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

1. පැමිණිලිකරුගේ දරුවා වන සයෝන් දීරද අරඹේවත්ත යන අය 2025 වර්ෂයේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට 1 වන වගඋත්තරකරු විසින් කටයුතු කළ යුතු ය.

2. පාසල් වල පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීමේ දී මෙවැනි තත්ත්වයන් තවදුරටත් ඇති වීම වැළක්වීම සඳහා විදුහල්පතිවරුන් හට අවශ්‍ය උපදෙස් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

2025. 08 . 20 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා

03. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා